# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2023 නොවැම්බර් මස 10 වැනි දින

## II වන කොටස

## අතිරේකය

## (2023.11.10 දින නිකුත් කරන ලදී)

# සමාගම් (සංශෝධන)

**2007 අංක 07 දරන සමාගම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගේ
නියමය පරිදි පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 9.00 තැපැල් ගාස්තුව : රු. 50.00

*මෙම ගැසට් අතිරේකය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

*2 වන වගන්තිය :* මෙම වගන්තිය මගින් (මෙහි මින්මතු “ ප්‍රධාන ප්‍රඥප්තිය” යනුවෙන් සඳහන් කරනු ලබන) 2007 අංක 07 දරන සමාගම් පනතේ 427 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ චංචල දේපළ පිළිබඳ සුරක්ෂිතලත් ගනුදෙනුවලට අදාළ විධිවිධාන සැලැස්වීම සඳහා 2023 අංක  දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත සම්මත කිරීමට ආනුෂංගිකව සමාගමක් විසින් ප්‍රදානය කරනු ලබන චල සෘණ භාර එම සුරක්ෂිතලත් ගනුදෙනු පනතේ විධිවිධානවලට යටත් කිරීම වේ.

*3 වන වගන්තිය :* මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 428 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ යම් චංචල දේපළක් පිළිබඳව වූ චල සෘණ භාරයක් ඇති කරන යම් සාධන පත්‍රයක් 2023 අංක  දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත යටතේ ලියාපදිංචි කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

*4 වන වගන්තිය :* මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 431 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ යම් චංචල දේපළක් පිළිබඳව ඇති කරන ලද චල සෘණ භාරවල ප්‍රමුඛතාව තීරණය කිරීමේ දී 2023 අංක  දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනතේ විධිවිධාන අදාළ කර ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

*5 වන වගන්තිය :* මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 433අ වන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එමගින් 2023 අංක  දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත අදාළ කර ගැනීමේ කාර්යය සඳහා “චල සෘණ භාරය” යන යෙදුමට අර්ථ නිරූපනයක් ඇතුළත් කරනු ලැබේ.

එල්.ඩී. - ඕ. 68/2017

**2007 අංක 07 දරන සමාගම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

1. (1) මේ පනත 2023 අංක  දරන සමාගම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ වගන්තියේ විධිවිධාන හැර මේ පනතේ විධිවිධාන, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධාන පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත්වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

2007 අංක 07 දරන පනතේ 427 වන වගන්තිය සංශෝධනය කිරීම

2. (මේ පනතේ "ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 2007 අංක 07 දරන සමාගම් පනතේ 427 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) ඡේදයේ "(117 වන අධිකාරය වන) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ විධිවිධානවලට'' යන වචන සහ ඉලක්කම් වෙනුවට "2023 අංක  දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනතේ විධිවිධානවලට'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 428 වන වගන්තිය සංශෝධනය කිරීම

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 428 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ " එය විකුණුම් පත්‍රයක් වූ ලෙස සලකා'' යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය තෙක් ඇති සියලු වචන සහ ඉලක්කම් වෙනුවට ''එය විකුණුම් පත්‍රයක් වූ ලෙස සලකා 2023 අංක  දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත යටතේ ලියාපදිංචි කළ යුතු අතර, එම පනතේ විධිවිධාන ඒ චල ඍණ භාරය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 431 වන වගන්තිය සංශෝධනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 431 වන වගන්තියේ (6) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

''(7) යම් සමාගමකට අයත් යම් චංචල දේපළක් 2023 අංක දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත යටතේ ලියාපදිංචි කර ඇති චල ඍණ භාරයකට යටත් වන අවස්ථාවක, ඒ පනතේ ඇතුළත් ප්‍රමුඛතාවට අදාළ විධිවිධාන ඒ චල ඍණ භාරයේ ප්‍රමුඛතාව නිශ්චය කිරීමේ දී අදාළ විය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියට 433අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 433 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 433අ වන වගන්තිය ලෙස බලපැවැත්විය යුතු යː-

''අර්ථ නිරූපනය

**433අ.** මේ පනතේ මේ කොටසෙහි ''චල ඍණ භාරය''යන්නෙන්, 2023 අංක දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනතේ විධිවිධාන අදාළ කර ගැනීමේ කාර්යය සඳහා ''සුරකු අයිතිවාසිකමක්'' අදහස් වේ.''.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**6.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී